# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**11 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **ඒකකය 1- නීතිය හා යුක්තිය**

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) "නීතිය යනු රාජ්‍යය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ පද්ධතියකි." යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවේ,
1) ජෝන් ඔස්ටන් විසිනි
2) ටී. එච්. ග්‍රීන් විසිනි
3) ඒබ්‍රහම් ලින්කන් විසිනි
4) මහාචාර්ය ගානර් විසිනි

(2) පහත මූලාශ අතුරින් නීතියේ මූලාශ්‍රයක් නොවන්නේ කුමක් ද?
1) ආගම
2) සිරිත් විරිත්
3) දේශීය නීතිය
4) අධිකරණ තීන්දු

(3) රාජ්‍යයක උත්තරීතර නීතිය වන්නේ,
1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි
2) අධිකරණ තීන්දුය
3) නීති විශාරදයන්ගේ මතය
4) අපරාධ නීතියයි

(4) දඬුවම් ලැබිය හැකි බරපතල වැරදි ගනයට අයත් නොවන්නේ පහත වැරදි අතරින් කුමක් ද?
1) පොදු දේපල වලට හානි කිරීම
2) සොරබඩු ළඟ තබා ගැනීම
3) ඉඩම් සම්බන්ධ ගැටලු
4) ස්ත්‍රී දූෂණ

(5) පළමු වරට කාති උසාවි පිහිටුවනු ලැබුවේ කුමන නඩු විසඳීම සඳහා ද?
1) උතුරු පළාත් දෙමළ වැසියන්ගේ නඩු
2) මුස්ලිම් නීතියට අනුව නඩු විසඳීම
3) උඩරට සිංහලයන්ගේ විවාහ, දික්කසාද, දේපළ උරුමය වැනි නඩු විසඳීමට
4) රටතුල පවතින විවිධ අර්බුද විසඳීමට

(6) 1973 යුක්තිය පසිඳලීමේ පනතට අනුව ශ්‍රී ලංකාවේ ඉහළම උසාවිය වන්නේ,
1) අභියාචනාධිකරණයයි
2) ශ්‍රේෂ්ඨාධිකරණයයි
3) මහාධිකරණයයි
4) පළාත්බද මහාධිකරණයයි

(7) පළාත් සභාව තුළ රිට් ආඥා නිකුත් කිරීම සම්බන්ධව අධිකරණ බලතල හිමි වන්නේ,
1) අභියාචනාධිකරණයටය
2) මහාධිකරණයටය
3) දිසා අධිකරණයටය
4) පළාත්බද මහාධිකරණයටය

(8) සමාදාන විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලය හිමි වන්නේ,
1) අග්‍ර විනිශ්චයකාරතුමාටය
2) අධිකරණ අමාත්‍යතුමාටය
3) නීතිපති තුමාටය
4) අගමැතිවරයාටය

(9) විධායක හා පරිපාලන ක්‍රියා මගින් පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කර වීම සඳහා ඔම්බුඩ්ස්මන් හෙවත් පරිපාලනය පිළිබඳ විශේෂ කොමසාරිස් තනතුර හඳුන්වා දෙනු ලැබුවේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද?
1) 1972
2) 1978
3) 1948
4) 1931

(10) නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංගයක් නොවන්නේ,
1) සෑම කෙනෙකුම රටේ නීතියට යටත් වීම.
2) සෑම දෙනාටම සර්ව සාධාරණ හා සමානව නීති ක්‍රියාත්මක කිරීම.
3) නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් ලෙස සැලකීම.

4) අපක්ෂපාතී නිශ්චිත, සාධාරණ හා යුක්ති සහගත පොදු නීති පද්ධතියක් තිබීම.

- ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(11) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය කුමක් ද?
(12) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග 2 ක් දක්වන්න.
(13) දඬුවම් ලැබිය හැකි බරපතල වැරදි 2 ක් නම් කරන්න.
(14) ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතල 2 ක් දක්වන්න.
(15) අධිකරණය සඳහා විනිශ්චයකරුවන් පත් කරනු ලබන්නේ කෙසේද?
(16) දිසා අධිකරණ වලට විසඳිය හැකි නඩු වර්ග 2 ක් දක්වන්න.
(17) නීතිපතිතුමාගේ කාර්යයන් 2 ක් දක්වන්න.
(18) නීතිපතිතුමාගේ බලතල හා කාර්ය ඉටු කිරීම සඳහා සහාය වන නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න.
(19) මානව හිමිකම් කොමිසමේ ප්‍රධාන කාර්යයන් දෙකක් දක්වන්න.
(20) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීමේ වැදගත්කම පිළිබඳ කරුණු දෙකක් දක්වන්න.

(3) පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
නීතිය නොදන සිටීම නිදහසට කරුණක් නොවේ. එබැවින් සෑම පුරවැසියකුටම නීතිය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතුය.

i) නීතියේ ගුණාංග 2 ක් ලියන්න.
ii) අපරාධ නීතිය යටතේ දඬුවම් ලබාදෙන වැරදි 3 ක් ලියන්න.
iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන 3 ක් නම් කොට ඉන් එකක ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.

(4) i) පුද්ගලයන් නීතිගරුක නොවීමෙන් සමාජයට අත්විඳීමට සිදුවන අයහපත් ප්‍රතිඵල 3 ක් ලියන්න.
ii) ශ්‍රී ලංකා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ගෙන ඇති පියවර 2 ක් ලියන්න.
iii) නීතිය තුල අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු ගුණාංග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(5) i) දේශීය නීතියේ ප්‍රභේද 3 නම් කරන්න.
ii) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමෝපායන් 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.
iii) ශ්‍රී ලංකාවේ මහාධිකරණය මගින් විසඳනු ලබන නඩු වර්ග 3 ක් ලියන්න.

සැකසුම:- අයි.ඩබ්.ඒ. අයෝමි මිය